සන්නස SANNASA

## ලියා දන්වන වග

### රටකට සක්‍රිය නීතියක් අවශ්‍යය

ඔස්ට්‍රේලියාවේ ඇඩිලේඩ්හි ආච්බිෂොප්වරයා වෙනත් පූජකයකු විසින් හැත්තෑව දශකයේදී කරන ලද ළමා ලිංගික අපචාරයක් සැඟවීමේ වරදට දඬුවම් ලබයි. ඔහු මුලු ලෝකයේම කතෝලික සභාවේ මෙවන් දඬුවමක් ලද ඉහළම පූජකවරයා බවට පත්විය. එසේ යයි කියා ඔහුගේ වරදට එරෙහිව නීතිය ක්‍රියාක්මක වීම නැවතුණේ නැත.

මලයාසියාවේ හිටපු අගමැතිවරයා මහජන දේපළ කොල්ලකෑම සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූයේ එයිට පසුව ය. ඔහුගේ නිවසේ තිබූ මුදල් කන්දරාව යන්ත්‍ර යොදා ගනිමින් ගණන් කරන්නට නිලධාරීන් පිරිසකට දින ගණනාවක් ගතවිය. සොයාගත් වස්තු සම්භාරය ඩොලර් කෝටි ගණනක වටිනාකමින් යුක්තය. විවිධාකාර අරමුදල් පිහිටුවාගනිමින් ඒවා හරහා තමන්ට මුදල් ගලා එන ක්‍රමවේද ඔහු විසින් සකස් කරනු ලැබ තිබුණි. ඔහු හිටපු අගමැතිවරයාය කියා අලුත් රජයේ අය නීතිය නවා ඔහු බේරාගන්නට ගියේ නැත. තමන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම නවත්වන්නටයයි කියා ඔහු කංකෙඳිරි ගෑවේවත් නැත.

ලෝකයේ ඉදිරියට යන රටක් වෙයි නම් ඒ ඕනෑම රටක දැකිය හැකි යහපත් ලක්ෂණයක් වනුයේ නිසි ලෙස ස්ථාපනය වූ සහ නිසි ලෙස පවත්වාගෙන යන්නා වූ නීතියක් තිබීම ය. නීතියක් නැති රටක ජනතාව සිටිය යුතු වන්නේ වල්මත් වූවන් ලෙස ය. දේශපාලන හෝ ආගමික හෝ වෙනයම් ගැතිකම් නිසා තමන් අදහන තමන් ගැතිවී සිටින වැරදකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාක්මකවීම හෙලාදකින්නෝ වෙත් නම් ඔවුහු ශිෂ්ඨසම්පන්න සමාජයකට සුදුසු වන්නෝ නොවෙති.

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe
editor@sannasa.com.au
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සහය සංස්කරණය / Asst Editor**
අසෝක සිල්වා Asoka Silva

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D** | Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සාලිය ගලප්පත්ති
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:** Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.



# ආගම කේන්ද්‍රීය වීම බරපතළ හානියක්



**ජිනසිරි දඩල්ලගේ හිටපු අමාත්‍යංශ ලේකම්**

ආගම සමාජ විද්‍යාත්මකව සමාජ සංස්ථාවක් ලෙස හඳුන්වන්න පුළුවන්. ඕනෑම රටක සමාජ සංස්ථාව ගොඩනැගී තිබෙන ආකාරය බැලුවහම ඒ ඒ රටවල තියෙන සමාජ සංස්ථාව බැඳිලා තිබෙනවා යම් යම් වෙනත් කාරණා එක්ක. උදාහරණයක් වශයෙන් ජාතීන් සමඟ බැඳිලා තිබෙනවා. බෞද්ධ ආගම ගතහොත් එය වැඩිපුර සිංහල ජාතිය සමඟ බැඳුණු ආගමක්. හින්දු ආගම වැඩිපුර ද්‍රවිඩ ජාතිය සමඟ බැඳී ඇති අතර ඉස්ලාම් ආගම ද්‍රවිඩ ජාතිය සමඟ බැඳී තිබෙනවා. සමාජයේ කොටස් ආගම් වලට සම්බන්ධ වෙලා ඉන්න ආකාරය, සමාජ විද්‍යාත්මකව බහුතරය, සුළුතරය යන ජාතික ස්ථර, ආගම් ස්ථර වත් තිබෙනවා. මේක සම්බන්ධ වෙනවා දේශපාලනයට. උදාහරණයක් වශයෙන් ජපානය වගේ බොහෝ දියුණු රටක් ගතහොත් මේක අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද සමජාතියක් තමයි එහි තියෙන්නේ. සිංගප්පූරුව වැනි රට වලට එය අවශ්‍ය වෙන්නේ නැහැ. මන්ද එය ඉතාම කළමනාකාරිත්වයකින් දේශපාලනය ගෙන යන රටක්. බටහිර රටවල් බැලූවත් ඉතා ඉහළ කළමනාකාරීත්වයක් තිබෙනවා ඒවායේ දේශපාලනයේ.

සිංගප්පූරුව ගත්තොත් ඒ රටේ හැමදේකටම තිබෙන්නේ ඉතාම විද්‍යාත්මක පදනමක්. රාජ්‍ය සේවය ගත්තත්, ආර්ථික සංවර්ධනය ගත්තත්, සමාජ කළමනාකරණය ගත්තත් ඒ දේවල් ඉතාම විද්‍යාත්මකයි. බටහිර දියුණු රටවලත් ඒ පදනම තිබෙනවා. ඔවුන් ආර්ථික විද්‍යා පදනම මත, සමාජ විද්‍යා පදනම මත, තමයි බොහෝ දේවල් වලදී කටයුතු කරන්නේ. අපේ රටේ වෙන්නේ, බලය ලබාගැනීම සඳහා ජාතිය, කුලය යන සාධක ප්‍රබල වෙනවා. ඒ කියන්නේ විද්‍යාත්මක දේශපාලනයක් නැහැ. විද්‍යාත්මක සමාජ කළමනාකරණයක් නැහැ. විද්‍යාත්මක ආර්ථික කළමනාකරණයක් නැහැ. විද්‍යාත්මක රාජ්‍ය සේවයක් නැහැ. කොටින්ම විද්‍යාත්මක දේශපාලනයක් ඇතතේම නැහැ. උදාහරණයක් විදිහට විද්‍යාත්මක අමාත්‍ය මණ්ඩලයක් පත්කළා කිව්වට එය ඉතාම අවිද්‍යාත්මකයි. මම බොහෝ රටවල සංචාරය කර, බොහෝ රටවල ප්‍රතිපත්ති අධ්‍යයනය කර තිබෙනවා. ඔවුන් සෑම විෂයකදීම විද්‍යාත්මක, කළමනාකරණය භාවිතා කරනවා. අපේ සමහර ස්ථර බැලූවොත් බොහෝදෙනා උත්සාහ කරන්නේ ජාතිකවාදී පදනමක් ම බලයට එන්නයි. එතකොට ඔවුනට සිද්ධ වෙනවා ජාතියට අමතන්න, ජාතික ප්‍රශ්න කියන ඒවා අරන් එනවා. ජාතීන්ට සලකන ප්‍රතිපත්ති අරන් එනවා. ආගමත් එහෙමයි. මේ ප්‍රතශතයට තමයි බෙදිලා තියෙන්නේ.

1956 භාෂාව පදනම් කරගත් සියලූ පොරොන්දු පැහැදිලිවම මහ ජාතියට දෙන ලද මානසික අල්ලස්. ආගමට දෙන්නෙත් එවැනි අල්ලස්. ආගමට දෙන එවැනි අල්ලසක් තමයි බුද්ධාගම තමයි රාජ්‍ය ආගම, පළවෙනි තැන බුද්ධාගමට කියලා කියන එක. එනම් රාජ්‍ය විසින් ආගම නඩත්තු කිරීම කියන සංකල්පය එතුළින් එනවා. මම ලෝකයේ කොහෙවත් දැකලා නැහැ රාජ්‍යයක් විසින් ආගමක් නඩත්තු කිරීමක්, එනම් රාජ්‍ය අනුග්‍රහය ලබා දීමක්.

අපේ රටේ ජාතික ප්‍රශ්නයක් තිබෙනවා. මහජාතිය සියයට හැත්තෑ ගණනක් සිටීම නිසා, ඔවුන් පිනවීමට, ඔවුන්ට මානසික වශයෙන් අල්ලස් දීම, මානසික වශයෙන් බැඳ තබාගැනීම ආදිය නිසා තමයි ජාතිවාදය එන්නෙත්.

මහජාතියේ බලය මඳිවෙනකොට සුළු ජාතීක්ට නොයෙක් දේවල් දෙන්න පොරොන්දු වෙලා බලයට එනවා. අපේ රටේ ජනාධිපතිවරණයේදී කියන කතාවක් කමයි සුළු ජාතික ඡන්ද නැත්නම් දිනන්න බැහැ කියන එක. ඒ අනුව ජාතිය මත තමයි තීරණ ගන්න බලන්නේ. ජාතිය මත තීරණ ගැනීමේදී අනිවාර්යයෙන්ම ආගමට සලකන්න වෙනවා. පසුව ආගම මත තීරණ ගැනීමටත් සිදු වෙනවා.

මේ විදිහට කාලයක් යනකොට මේ දේශපාලනය හා ආගම අන්‍යන්‍යොව යැපෙන ගතියක් ඇති වෙනවා. ඒ කියන්නේ දේශපාලනයට ආගම නැතිව බැහැ. ආගමට දේශපාලනය නැතිව බැහැ කියන උච්චස්ථානයට ඇවිල්ලා තියනවා. රටේ දේපොළ යොදාගන්නවා ආගම නඩත්තු කිරීමට. මේ තත්ත්වය ක්‍රමිකව විකාශනය වෙලා තමයි ආගමික නායකයන්ගේ උපදෙස් ගැනීමට යන්නේ. ආගමික කාර්යභාරය වශයෙන් මම දකින්නේ, සමාජ සාරධර්ම වැඩි දියුණු කිරීම්, මිනිසුන්ගේ හික්මීම ඇති කිරීම. මේක තමයි ආගමේ කාර්යභාරය. නමුත් අපේ සමාජයේ ආගමට එවැනි වගවීමක් නැහැ. ආගම් කර්තෘවරු මේ දේවල් සඳහා වතවීමක් නැහැ. ඒකත් පවරනවා දේශපාලනයට. නමුත් ආගම් වලිනුත් සමාජය ගොඩනැගීමට බලපෑමක් තියෙන්න ඕනේ. නමුත් ඒක නොවී දේශපාලනයයි, ආගමයි, අන්‍යන්‍ය වශයෙන් යැපීම නිසා දේශපාලනඥයන්ට සිද්ධ වෙනවා ආගම් වල යම් යම් තත්ත්වයන්ට එකඟවෙන්න.

ආගමික සහතිකයක් ලබා ගන්න ඔවුන්ට අවශ්‍ය වෙනවා. ඒ නිසා තමයි දේශපාලනයට බලපෑම් කිරීමට ආගමික සමාජය ඉදිරියට ඇවිල්ලා ඉන්නේ. දේශපාලන සමාජය විද්‍යාත්මක නැහැ. දේශපාලන සමාජය ජාතිවාදය, ආගම්වාදය මත යැපෙනවා. ඒ නිසා අන්‍යන්‍ය යැපීමේ මටට්මක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා ආර්ථික සමාජ කළමනාකරණයට පමණක් නොවේ දේශපාලන කළමනාකරණයටත් විද්‍යාත්මක ප්‍රවේශයක් භාවිතා කරනවා නම්, ආගමික සංස්ථාව පසුපස යන්න අවශ්‍ය නැහැ. ඔය හිට්ලර්ගේ කතාව පවා පෙන්වන්නේ සමාජය පිරිහිලා, දේශපාලන නායකත්වයක් නැහැ කියන එකයි. සමාජය පිරිහිලා තියෙන්නේ දේශපාලනය නිසා කියලා තමයි ආගමික සමාජය හිතන්නේ. අනෙක් පැත්තෙන් ඔවුන්ගේ කාර්යභාරය ඉටුවුණානම් සමාජය පිරිහෙන්නේ නැහැ.

**වින්දයා ගමගේ**
ravaya.lk